# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2452/21 - 2025 සැප්තැම්බර් මස 03 වැනි බදාදා - 2025.09.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමණාකරණ පනතේ 16(2ඇ) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම**

යෝජිත ඒකක 288කින් සමන්විත මහල් නිවාස ව්‍යාපෘතිය

අංක 13, අගරදගුරු නිකලස් මාකස් ප්‍රනාන්දු මාවත, බෝලවලාන, මීගමුව

**පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව**

1988 අංක 64 හා 2011 අංක 49 දරන පනත් මගින් සංශෝධිත 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 16(1) වගන්තියේ විධිවිධාන වලට අනුකූලව බත්තරමුල්ල, පන්නිපිටිය පාර, අංක 1087 දරන ලිපිනයේ හෝම් ලැන්ඩ් ස්කයිලයින් පුද්ගලික සමාගම විසින් ඉදිරිපත් කරන ලද මීගමුව, බෝලවලාන, අගරදගුරු නිකලස් මාකස් ප්‍රනාන්දු මාවත, අංක 13 දරන ස්ථානයේ ඉදිකිරීමට යෝජිත ඒකක 288කින් යුත් මහල් නිවාස ව්‍යාපෘතිය සඳහා වූ පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව මහජන පරීක්ෂාව සඳහා පහත සඳහන් ස්ථානවල දිනපතා පෙ.ව. 8.30 සිට ප.ව. 4.15 දක්වා 2025.09.03 දින සිට දින 30ක කාලයක් සඳහා තබා ඇත. (සති අන්ත සහ රජයේ නිවාඩු දිනයන් හැර)

මීට අමතරව වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වන www.coastal.gov.lk මගින් එම වාර්තාව භාෂා තුනෙන්ම පරිශීලනය සඳහා ඉදිරිපත් කර ඇත.

01. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, 4 වන මහල, නව මහ ලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10.

02. මධ්‍යම පරිසර අධිකාරිය, අංක 104, "පරිසර පියස", ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.

03. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ.

1A - G 45268 — 24 (2025/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

04. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මීගමුව.

05. මහ නගර සභාව. මීගමුව.

06. මධ්‍යම පරිසර අධිකාරිය, දිස්ත්‍රික් කාර්යාලය, ගම්පහ.

07. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් කාර්යාලය, කටුබැද්ද, මීගමුව.

08. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය කාර්යාලය, මීගමුව.

මෙම යෝජිත ව්‍යාපෘතිය නිසා පරිසරය කෙරෙහි වන බලපෑම් පිළිබඳ පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව සම්බන්ධව මහජන අදහස් 2025.09.03 දින සිට දින 30ක් ඇතුළත වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිඛිතව ඉදිරිපත් කරන ලෙස දන්වමි.

**මහාචාර්ය පී. බී. ටර්නි ප්‍රදීප් කුමාර,**
අධ්‍යක්ෂ ජනරාල්,
වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත්
කළමනාකරණ දෙපාර්තමේන්තුව.

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව,
නව මහලේකම් කාර්යාලය,
4 වන මහල, මාලිගාවත්ත,
කොළඹ 10.

දුරකථන අංක : 011 2449754, 011 2387922, 011 2449197
ෆැක්ස් අංක : 011 2438005, 0112472623
ඊ මේල් : dg.ccd.lk@gmail.com

EOG 09- 0001